# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1705/4 – 2011 මැයි 09 වැනි සඳුදා – 2011.05.09

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ ආඥාව

**2011 අංක 63 දරන ආඥාව අවලංගු කිරීම**

මගේ යොමු අංකය: එල්ඩී/05/2010/සීර්බී/310.
ප්‍රාදේශීය ලේකම්ගේ යොමු අංකය: 6/37/23.

1972 අංක 18 සහ 1974 අංක 29 දරන අර්ථ නිරූපන (සංශෝධිත) පනත් වලින් සංශෝධිත අර්ථ නිරූපන ආඥා පනතේ (12 වැනි අධිකාරය) 18 වැනි වගන්තියට අනුකූලව ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍ය ජනක බණ්ඩාර තෙන්නකෝන් වන මම අංක 1700/27 හා 2011 අප්‍රේල් 08 වැනි දිනැති *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශේෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද, ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය) 38 (අ) අතුරු විධානය යටතේ 2011 අංක 63 දරන ආඥාව මෙයින් අවලංගු කරමි.

ජනක බණ්ඩාර තෙන්නකෝන්,
ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍ය.

2011 මැයි මස 03 වැනි දින,
ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය,
අංක 80/5, 'ගොවිජන මන්දිරය',
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

05 – 539

---

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ ආඥාව

**2011 අංක 84 දරන ආඥාව**

මගේ යොමු අංකය: එල්ඩී/05/2010/සීර්බී/310.
ප්‍රාදේශීය ලේකම්ගේ යොමු අංකය: 6/37/23.

ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය) 38 වැනි වගන්තියේ (අ) අතුරු විධානයෙන් මා වෙත පවරා ඇති බලතල අනුව ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍ය ජනක බණ්ඩාර තෙන්නකෝන් වන මම පහත සඳහන් උපලේඛනයේ 1 වැනි ඡේදයේ සඳහන් ඉඩම් අත්කර ගැනීමේ නිලධාරියාට නැතහොත්, එකී නිලධාරියා විසින් ඒ සඳහා බලය දෙන ලද වෙනත් නිලධාරියකුට, එම උපලේඛනයේ 2 වැනි ඡේදයේ දැක්වෙන නියමිත ඉඩම ස්වාමිත්වයට ගැනීමට මෙයින් නියම කරමි.

ජනක බණ්ඩාර තෙන්නකෝන්,
ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍ය.

2011 මැයි මස 03 වැනි දින,
ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය,
'ගොවිජන මන්දිරය',
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

උපලේඛනය

1. **ඉඩම් අත්කර ගැනීමේ නිලධාරියා.**– ප්‍රාදේශීය ලේකම්, නාවුල.

2. **ඉඩමේ විස්තරය.**– මධ්‍යම පළාතේ මාතලේ දිස්ත්‍රික්කයේ නාවුල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ වගපනහ උඩසිය පත්තුව සුළු කොට්ඨාසයේ කරවිලහේන ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක Ma/NUL/2011/38 හා 2011.03.23 දිනැති ප්‍රගමන

අනුරේඛනයේ කැබලි අක්ෂර "ඒ" සිට "ඩී" වශයෙන් දක්වා ඇති ප්‍රමාණයෙන් හෙක්. 2.3670 වූ ඉඩම් කොටස් වලට මායිම්:

01. **කැබලි අක්ෂර 'ඒ' – කිරවනාසල්ලිය – ප්‍රමාණය: හෙක්. 1.2915**
උතුරට: මාර්ග (මා.සං.අ.) සහ කැබලි අක්ෂර සී; නැගෙනහිරට: කැබලි අක්ෂර සී, බී සහ එච්. එම්. සිරිල් ආරියරත්න, ප්‍රියංගිකා හේරත් සහ කේ. ඩබ්. ඩී. කරුණාතිලක හිමිකම් කියන කිරිවනාසල්ලිය ඉඩම; දකුණට සහ බටහිරට: කේ. ඩබ්. ඩී. කරුණාතිලක හිමිකම් කියන කිරවනාසල්ලිය ඉඩම.

02. **කැබලි අක්ෂර 'බී' – කිරවනාසල්ලිය – ප්‍රමාණය: හෙක්. 0.9643**
උතුරට: මාර්ග (මා.සං.අ.); නැගෙනහිරට: ශ්‍රී බෝධිමළු විහාරය, පී. ජී. පී. චන්ද්‍රලතා සහ තවත් අය හිමිකම් කියන කිරවනාසල්ලිය ඉඩම; දකුණට: එච්. එම්. සිරිල් ආරියරත්න, කේ. ඩබ්. ඩී. කරුණාතිලක හිමිකම් කියන කිරිවනාසල්ලිය ඉඩම සහ කැබලි අක්ෂර ඒ; බටහිරට: කැබලි අක්ෂර ඒ, සී සහ ඩී සහ ටී. ජී. පුංචි මැණිකේ හිමිකම් කියන කිරවනාසල්ලිය ඉඩම.

03. **කැබලි අක්ෂර 'සී' – කිරවනාසල්ලිය – ප්‍රමාණය: හෙක්. 0.0985**
උතුරට: මාර්ග (මා.සං.අ.) සහ ටී. ජී. පුංචි මැණිකේ හිමිකම් කියන කිරවනාසල්ලිය ඉඩම; නැගෙනහිරට: ටී. ජී. පුංචි මැණිකේ හිමිකම් කියන කිරවනාසල්ලිය ඉඩම සහ කැබලි අක්ෂර ඩී සහ බී; දකුණට: කැබලි අක්ෂර බී සහ ඒ; බටහිරට: කැබලි අක්ෂර ඒ.

04. **කැබලි අක්ෂර 'ඩී' – කිරවනාසල්ලිය – ප්‍රමාණය: හෙක්. 0.0127**
උතුරට: ටී. ජී. පුංචි මැණිකේ හිමිකම් කියන කිරවනාසල්ලිය ඉඩම; නැගෙනහිරට: කැබලි අක්ෂර බී; දකුණට: කැබලි අක්ෂර සී; බටහිරට: ටී. පී. පුංචි මැණිකේ හිමිකම් කියන කිරවනාසල්ලිය ඉඩම.

05 – 540

---

## ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

### 39 අ (1) වැනි වගන්තිය යටතේ නියමය

2005 මැයි මස 10 වැනි දින අංක 1392/6 දරන *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ* අතිවිශේෂ ගැසට් පත්‍රයෙහි පළ කරන ලද 2005 අංක 44 දරන (460 වන අධිකාරිය වූ) ඉඩම් අත්කර ගැනීමේ පනතේ 38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ ආඥාවෙන් මෙහි පහත I වන උපලේඛනයෙහි සඳහන් ඉඩම් කොටස් රජය වෙත සම්පූර්ණයෙන් ම සතු වී ඇති අතර, රජය සඳහා සහ ඒ වෙනුවෙන් එකී පනතේ 40 වැනි වගන්තියෙහි (අ) ඡේදය යටතේ එම ඉඩම් කොටස්වල සන්තකය ද ලබාගෙන තිබේ. එහෙත් එම පනතේ (1979 අංක 8 දරන පනතින් ඇතුළත් කරන ලද) 39අ(1) වැනි වගන්තියේ උප වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍ය ජනක බණ්ඩාර තෙන්නකෝන් වන මම, මෙහි පහත II උපලේඛනයෙහි සඳහන් ඉඩම් කොටස මෙම නියමය මගින් අවසතු කරමි.

ජනක බණ්ඩාර තෙන්නකෝන්,
ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍ය.

මගේ අංකය: එල්03ජේ/93/එල්ආර්බී/12.
ප්‍රාදේශීය ලේකම්ගේ අංකය: 2/5/001/2044.
2011 මැයි මස 03 වැනි දින,
ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය,
අංක 80/5, 'ගොවිජන මන්දිරය',
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

I වන උපලේඛනය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ ජාඇල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ රාගම් පත්තුව සුළු කොට්ඨාසයේ රාගම ගමේ පිහිටි, ගම්පහ කොට්ඨාස භාර මැනුම් අධිකාරි විසින් සකස් කර ඇති අංක ගම්/ජාඇල/93/020 හා 1994.06.24 දිනැති ප්‍රගමන අනුරේඛනයේ කැබලි අංක 4, 5ඒ, 5සී, 5ජේ, 6, 7සී, 11, 14, 16 වශයෙන් පෙන්නුම් කර ඇති මුළු ප්‍රමාණයෙන් හෙක්. 21.6665 ක් පමණ වූ පහත සඳහන් නම් වලින් ප්‍රමාණයන්ගෙන් සහ මායිම් වලින් යුක්ත ඉඩම් කොටස්:

01. **කැබලි අංක 04 – ගොඩකඳුරුගහ දෙනිය – ප්‍රමාණය: හෙක්. 0.464ක්**
උතුරට: ඩී. එස්. මැන්දිස් සහ තවත් අය හිමිකම් කියන ඉඩම; නැගෙනහිරට: තොම්සගෙවත්ත; දකුණට: කැබලි අංක 5; බටහිරට: තොම්බගෙවත්ත.

02. **කැබලි අංක 5ඒ – තල්ගහලියද්ද සහ ගොඩකඳුරුගහදෙනිය – ප්‍රමාණය: හෙක්. 19.875 ක් පමණ**
උතුරට: ඇළ සහ කැබලි අංක 5සී, 5බී, තොම්බගෙවත්ත, කැබලි අංක 4, තොම්බගෙවත්ත, කැබලි අංක 5ඩී, පොල්පිටිය කුඹුර, කැබලි අංක 7සී සහ 5එෆ්; නැගෙනහිරට: කැබලි අංක 4, 6, 5ඩී, 5එෆ්, තොම්බගෙවත්ත, කැබලි අංක 7සී, 5එෆ්, දුම්රිය මාර්ගය සඳහා වෙන්කළ බිම, කැබලි අංක 5ජේ, 5කේ, 5එල්, 11 සහ කාණුව, ගොඩකඳුරුගහවත්ත; දකුණට: වරි. අංක 31 සහ තවත් අය හිමිකම් කියන ගෙවත්ත, කැබලි අංක 5ඊ, 10, 9, 5ජේ, 5කේ, 5එල්, 11 සහ කාණුව සහ කැබලි අංක 05එම් ; බටහිරට: ඇළ, කැබලි අංක 5සී, 5බී, සහ තොම්බගෙවත්ත, පොල්පිටිය කුඹුර, කැබලි අංක 6, 7සී, 5එෆ් කැබලි අංක නොයෙදූ ඇළ, ව.අ. 31 සහ තවත් අය හිමිකම් කියන ගෙවත්ත සහ කැබලි අංක 10.

03. **කැබලි අංක 5සී – තල්ගහලියද්ද සහ ගොඩකඳුරුගහදෙනිය – ප්‍රමාණය: හෙක්. 0.2370 ක් පමණ**
උතුරට: කැබලි අංක 1ඒ සහ 5බී; නැගෙනහිරට: කැබලි අංක 5ඒ සහ 5බී; දකුණට: කැබලි අංක 5ඒ සහ ඇළ; බටහිරට: ඇළ සහ කැබලි අංක 1ඒ.

04. **කැබලි අංක 5ජේ – තල්ගහලියද්ද සහ ගොඩකඳුරුගහදෙනිය – ප්‍රමාණය: හෙක්. 0.0415 ක් පමණ**
උතුරට: කැබලි අංක 5එල්, 5කේ, 5ඒ; නැගෙනහිරට සහ දකුණට: කැබලි අංක නොයෙදූ ඇළ; බටහිරට: කැබලි අංක 5එල්, 5කේ සහ 5ඒ.

05. **කැබලි අංක 06 – ගොඩකඳුරුගහදෙනිය – ප්‍රමාණය: හෙක්. 0.031 ක් පමණ**
උතුරට: තොම්බගෙවත්ත; නැගෙනහිරට, දකුණට සහ බටහිරට: කැබලි අංක 5.

06. **කැබලි අංක 7සී – පොල්පිටිය කුඹුර – ප්‍රමාණය: හෙක්. 0.0380 ක් පමණ**
උතුරට: පොල්පිටිය කුඹුර සහ කැබලි අංක 7බී; නැගෙනහිරට: කැබලි අංක 7බී, 5එෆ් සහ 5ඒ; දකුණට: කැබලි අංක 5එෆ් සහ 5ඒ; බටහිරට: කැබලි අංක 5 සහ පොල්පිටිය කුඹුර.

07. **කැබලි අංක 11 – පොල්පිටිය කුඹුර – ප්‍රමාණය: හෙක්. 0.385 ක් පමණ**
උතුරට: කැබලි අංක 5; නැගෙනහිරට: ඇළ; දකුණට සහ බටහිරට: කැබලි අංක 5.

08. **කැබලි අංක 14 – තල්ගහලියද්ද සහ ගොඩකඳුරුගහදෙනිය – ප්‍රමාණය: හෙක්. 0.0865 ක් පමණ**
උතුරට: නන්දනී රාමනායක සහ තවත් අය හිමිකම් කියන පොල්පිටිය කුඹුර; නැගෙනහිරට සහ දකුණට: කැබලි අංක 5ඒ; බටහිරට: කැබලි අංක 5ඒ, 3, 5අයි, 5එච්, 5ජී, 8 සහ 7ඒ.

09. **කැබලි අංක 16 – පහලඒදණ්ඩ කුඹුර, තල්ගහකුඹුර, ඒදණ්ඩකුඹුර, තල්ගහලියද්ද සහ ගොඩකඳුරුගහදෙණිය – ප්‍රමාණය: හෙක්. 0.5085 ක් පමණ**

උතුරට: මහබාගේ - රාගම මහා මාර්ගය, කැබලි අංක 2, 3 සහ ඩෙනිස් ද සිල්වා හිමිකම් කියන ව.අ. 83 දරන ඉඩම; නැගෙනහිරට: කැබලි අංක 03 සහ ඩෙනිස් ද සිල්වා හිමිකම් කියන ව. අ. 83 දරන ඉඩම; දකුණට: කැබලි අංක 5ඒ සහ 15; බටහිරට: කැබලි අංක 15.

II වන උපලේඛනය

ගම්පහ දිස්ත්‍රික්කයේ ජාඇල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ රාගම් පත්තුව සුළු කොට්ඨාසයේ රාගම ගමේ පිහිටි, ගම්පහ කොට්ඨාස භාර මැනුම් අධිකාරී 2007.10.22 දිනැතිව සකස් කරන ලද අංක ගම්. 3542ක දරන මූලික පිඹුර නැවත 2008.05.29 දිනැතිව සංශෝධනය කර සකස් කරන ලද සංශෝධිත අංක ගම් 3542 දරන මූලික පිඹුරේ කැබලි අංක 69 වශයෙන් පෙන්නුම් කර ඇති මුළු ප්‍රමාණයෙන් හෙක්. 0.0905 ක් වූ පහත සඳහන් නම් වලින් ප්‍රමාණයන්ගෙන් සහ මායිම් වලින් යුක්ත ඉඩම් කොටස්:

01. **කැබලි අංක 69 – විලකුඹුර – ප්‍රමාණය: හෙක්. 0.0905 ක්**

උතුරට: මාර්ගය සහ කැබලි අංක 26; නැගෙනහිරට: කැබලි අංක 70; දකුණට: කැබලි අංක 70 සහ 31; බටහිරට: කැබලි අංක 31 සහ මාර්ගය.

05 - 541

---

## ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ ආඥාව

**2011 අංක 81 දරන ආඥාව**

මගේ යොමු අංකය: එල්ඩී/05/2010/එච්ඩබ්/එස්ටීඩීපී/ඒඩීබී/61.
ප්‍රාදේශීය ලේකම්ගේ යොමු අංකය: ප්‍රාලේ/අක්/අධි/අති/58.

ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය) 38 වැනි වගන්තියේ (අ) අතුරු විධානයෙන් මා වෙත පවරා ඇති බලතල අනුව, ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍ය ජනක බණ්ඩාර තෙන්නකෝන් වන මම පහත සඳහන් උපලේඛනයේ 1 වැනි ඡේදයේ සඳහන් ඉඩම් අත්කර ගැනීමේ නිලධාරියාට නැතහොත්, එකී නිලධාරියා විසින් ඒ සඳහා බලය දෙන ලද වෙනත් නිලධාරියකුට, එම උපලේඛනයේ 2 වැනි ඡේදයේ දැක්වෙන නියමිත ඉඩම ස්වාමිත්වයට ගැනීමට මෙයින් නියම කරමි.

ජනක බණ්ඩාර තෙන්නකෝන්,
ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍ය.

2011 මැයි මස 03 දින,
'ගොවිජන මන්දිරය',
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

උපලේඛනය

1. **ඉඩම් අත්කර ගැනීමේ නිලධාරියා.**– ප්‍රාදේශීය ලේකම්, අක්මීමණ.

2. **ඉඩමේ විස්තරය.**– ගාල්ල දිස්ත්‍රික්කයේ, අක්මීමණ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, බටදූව ගමේ පිහිටි, සර්වේ ජනරාල්ගේ අංක ජීඒ/ඒකේඑම්/10/285 හා 2010.08.26 දිනැතිව නිකුත් කර නැවත 2011.04.06 දිනැතිව සංශෝධනය කරන ලද ප්‍රගමන අනුරේඛනයේ කැබලි අක්ෂර "ඒ" වශයෙන් සඳහන් ප්‍රමාණයෙන් හෙක්. 0.0287ක් පමණ වූ වික්‍රමසිංහ මුදියන්සෙගෙවෙල නමැති පහත සඳහන් ඉඩම් කොටසට මායිම්:

උතුරට: ඒ. එච්. එම්. කලීල් සහ තවත් අය හිමිකම් කියන වික්‍රමසිංහ මුදියන්සෙගෙවෙල; නැගෙනහිරට: ඒ. එච්. එම්. කලීල් සහ තවත් අය හිමිකම් කියන වික්‍රමසිංහ මුදියන්සෙගෙවෙල සහ ඇළ; දකුණට: ඇළ සහ ඒ. එච්. එම්. කලීල් සහ තවත් අය හිමිකම් කියන වික්‍රමසිංහ මුදියන්සෙගෙවෙල; බටහිරට: ඒ. එච්. එම්. කලීල් හිමිකම් කියන වික්‍රමසිංහ මුදියන්සෙගෙවෙල සහ දක්ෂිණ අධිවේගී මාර්ගය.

05 - 542

---

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.